සියලු ම විද්‍යාර්ථීන් වෙත,

2025.03.07 දින පැවති 2025/03 දරන අභියාචනා කමිටුවේ දී විභාවලට අදාළ අභියාචනා ඉදිරිපත් කිරීමේ දී විද්‍යාර්ථීන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳව සියලු විද්‍යාර්ථීන් නැවත දැනුවත් කිරීමට තීරණය විය. 2023/2024 අධ්‍යයන වර්ෂයේ සිට මෙම කරුණු තරයේම ක්‍රියාත්මක වන බව ද වැඩිදුරටත් දන්වමි.

වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ දී ,

1) විෂය ඒකකයට/ ඒකකවලට අදාළ පරීක්ෂණය අවසන් වී දින 14 ක් ඇතුළත වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතු වේ.

( අඛණ්ඩව විෂයය ඒකක 2කට හෝ වැඩි ගණනකට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවකදී අවසාන විෂයය ඒකකයට අදාළ දිනයේ සිට දින 14 ක් තුළ දී ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය. )

උදා :- යම් මාසයක පළමු,දෙවන,තෙවන යන දිනවල විෂයය ඒකක 3ක් පවත්වා ඒවාට පෙනී සිටීමට නොහැකි වූයේ නම් එම තෙවන දින සිට දින 14ක් තුළ ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

2) වෛද්‍ය හේතූන් මත අභියාචනා ඉදිරිපත් කරන විට වෛද්‍ය සහතික සමග පෙනී නොසිටි විෂයයට / විෂයයන්ට අදාළ විභාග ප්‍රවේශ පත්‍රය ද ඒ සමග අමුණා ඉදිරිපත් කළ යුතු වේ.

3) (විද්‍යාර්ථීන් විසින්) වෛද්‍ය හේතූන් මත අභියාචනා ඉදිරිපත් කිරීමේදී අභියාචනා කමිටුවේ නිර්දේශ මත සනාතන සභාව විසින් අනුමත කරන ලද

පහත සඳහන් වෛද්‍ය සහතික පමණක් භාරගනු ලැබේ.

- විශ්වවිද්‍යාලීය වෛද්‍යවරයෙකු හෝ විශ්වවිද්‍යාලීය ආයුර්වේද වෛද්‍යවරයෙකු විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික.
- රජයේ රෝහලකින් (දේශීය / බටහිර) නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික සහ බෝවන රෝග සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකු (MOH) විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික
- පෞද්ගලික හෝ රජයේ රෝහල් ගතවීමකදී නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික (දේශීය / බටහිර)
- **පෞද්ගලික වෛද්‍ය සහතික** (දේශීය හෝ බටහිර) - විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් **පමණක්** නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික. **එම වෛද්‍ය සහතික විශ්වවිද්‍යාල වෛද්‍යවරයා විසින් සහතික කිරීම අනිවාර්ය වේ.**

4) ඉදිරිපත් කරනු ලබන අභියාචනා අයදුම්පතේ සහ වෛද්‍ය සහතිකයේ ඡායාපිටපත් ඔබ සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

අ.පි.බ.

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි ශිෂ්‍ය කණ්ඩායම ද ඇතුළත්ව ඉදිරි අධ්‍යයන වර්ෂවල ශිෂ්‍යයන් වෛද්‍ය හේතු මත හෝ නැවත විභාගවලට පෙනී සිටීම සඳහා ගෙවිය යුතු මුදල පහත දැක්වේ.

| ගෙවීම් වර්ගය | පළමු වරට ඉදිරිපත් කරන අභියාචනා සඳහා | දෙවන හා තුන්වන වරට ඉදිරිපත් කරන අභියාචනා සඳහා |
|---|---|---|
| වෛද්‍ය හේතු මත | (පාඨමාලා ඒකකයකට) රු 100 00 | (පාඨමාලා ඒකකයකට) රු 500 00 |
| නැවත පෙනී සිටීම හෝ වෙනත් ඕනෑම අවස්ථාවක | (පාඨමාලා ඒකකයකට) රු 500 00 | (පාඨමාලා ඒකකයකට) රු 500 00 |

5.ඔබගේ අභියාචනා සඳහා අදාළ අවශ්‍යතා සඳහා නියමිත අයදුම්පත්‍ර පමණක් ඉදිරිපත් කරන ලෙසත්, ලිපි මඟින් ඉදිරිපත් කරන දැනුම් දීම් ප්‍රතික්ෂේප කිරීමටත් තීරණය විය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී/ශාස්ත්‍රීය
2025.04.04

සභාපති/අභියාචනා කමිටුව
2025.04.04